## කාර්ය පත්‍රිකා - අංක 4

**උපදෙස් :**
ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**1 වන ඒකකය - 4 පාඩම**

**01. පරිගණකයක් මිල දී ගැනීමේදී සලකා බැලිය යුතු තාක්ෂණික නොවන පිරිවිතර ඇතුළත් පිළිතුර තෝරන්න.**

1. සකසනයේ වේගය, මිල, වගකීම
2. වගකීම, අලෙවියෙන් පසු සේවා, මිල
3. දීර්ඝ කළ වගකීම, මිල, සංදර්ශකය
4. ප්‍රධාන මතකය, අලෙවියෙන් පසු සේවා, වගකීම

**02. පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.**

1. පරිගණකයක මිල පමණක් සැලකිල්ලට ගෙන පරිගණක තෝරා ගැනීම නොකළ යුතුය. (සත්‍යයි / අසත්‍යයි)
2. පරිගණක පර්යන්ත උපාංග යනු ආදාන, ප්‍රතිදාන හා ආචයන උපාංග වේ. (සත්‍යයි / අසත්‍යයි)
3. පිරිවිතර යනු ගුණාත්මක බව හෝ ප්‍රමාණාත්මක බව හෝ පිළිබඳව පවතින පොදු ලක්ෂණ වේ. (සත්‍යයි / අසත්‍යයි)
4. සේවාදායක පරිගණක, වැඩහල් පරිගණක නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක වලට උදාහරණ නොවේ. (සත්‍යයි / අසත්‍යයි)

**03. නිවැරදි පිළිතුර තෝරා අදාළ හිස්තැනට යොදන්න.**

| නිෂ්පාදක වගකීම / වගකීම / දීර්ඝ කළ වගකීම / වැඩ බිමේ වගකීම |
| --- |

නිෂ්පාදන සමාගම විසින් භාණ්ඩය සඳහා ලබා දෙන වගකීම .......................... ලෙස හඳුන්වන අතර නිෂ්පාදන සමාගම ලබා දෙන වගකීම් කාලයට අතිරේකව දීර්ඝ කර ලබා ගන්නා වගකීම .................................... වේ.
පරිගණක යන්ත්‍රයක් මිලදී ගන්නා විට ලබා දෙන .......................... සලකා බැලිය යුතු වැදගත් සාධකයකි.

**04. USB කෙවෙනියට සම්බන්ධ කළ හැකි පර්යන්ත උපාංග තෝරන්න.**

1. බාහිර දෘඪ තැටිය
2. සුපරීක්ෂකය
3. සංදර්ශකය
4. තීරු කේත කියවනය

**05.** පරිගණකයක් මිලදී ගැනීමේදී සලකා බැලිය යුතු පිරිවිතර වෙන් කර දක්වන්න.



| | |
|---|---|
| තාක්ෂණික | මිල |
| තාක්ෂණික නොවන | |
| වගකීම | |
| සකසනයේ වේගය | |
| පරිගණක පිරිවිතර | |
| මතක ධාරිතාව | |
| අලෙවියෙන් පසු සේවා | |
| දෘඪ තැටියේ ධාරිතාව | |
| කීර්තිනාමය | |

**06.** රූපසටහනට අදාළ කෙවෙනිය හෝ ජාල සම්බන්ධතාවය තෝරන්න.









- USB Port
- Network Port
- Bluetooth
- Wi - Fi